150

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 5 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2006

ඉඩම් නීතිය - **LWU 3312/4332**

කාලය - පැය (03) තුනයි

---

දිනය - 2006.05.04 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

*<u>ප්‍රශ්න පහකට</u> පමණක් පිළිතුරු සපයන්න.*
*අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.*

01. (අ) "ප්‍රමුඛතාවය (පූර්වතාවය) පිළිබඳ සිද්ධාන්තය ..... බලපාන්නේ අයිතිවාසිකම පැවරීම සම්බන්ධයෙන් පමණකි. එකම දෙය සඳහා පූර්ව හිමිකම් කියාපෑම තහවුරු කිරීම සඳහා හැර අනික් සියළු කරුණු සම්බන්ධයෙන් ලියාපදිංචි නොකළ සාධන පත්‍රයක් කෙරෙහි කිසි බලපෑමක් සිදු නොවේ. මගේ අදහසේ හැටියට ස්වාධීන මුල් අයිතිවාසිකමක් තහවුරු කර ගැනීම සඳහා සාක්ෂියක් වශයෙන් ලියාපදිංචි නොකළ නීත්‍යනුකූල ලේඛණයක බලපෑම ආඥා පනත මගින් වෙනස් කර නොමැත."

*එනිස් විනිසුරු, මොහොමඩ් අලි එ වීරසූරිය (1914) 17* ***NLR*** *424*

ඉහත ප්‍රකාශය අනුසාරයෙන් ලියාපදිංචිය මඟින් පූර්වතාවය ලැබීම යන සංකල්පය විවේචනාත්මකව අගයන්න. විනිශ්චිත නඩු තීරණ ඇසුරෙන් ඔබගේ පිළිතුර තහවුරු කරන්න.

(ආ) පියදාස 1991 දී තම ජීවිත බුක්තියට යටත්ව දංගොල්ල නමැති ඉඩම ජිනදාසට තෑගි කළේය. ජිනදාස මෙම තෑගි ඔප්පුව ලියාපදිංචි නොකළේය. 1997 දී පියදාස මිය ගිය අතර ඉන් පසුව පියදාසගේ පුතු වන අනුර දංගොල්ලද ඇතුළුව සියළු දේපළවල එකම උරුමකරු බවට පත් විය. වසර 2005 දී අනුර දංගොල්ල නලීන්ට පැවරූ අතර පසුව නලින් මෙම විකුණුම් ඔප්පුව ලියාපදිංචි කළේය. මේ අතර නලීන් ලියාපදිංචි කිරීමෙන් පූර්වතාවය ලැබීම යන කරුණු මගින් දංගොල්ල ලබාගෙන ඇත යන පදනම මත අයිතිය ප්‍රකාශ කිරීමේ නඩුකරයක් ජිනදාසට එරෙහිව ගෙන ආවේය. කෙසේ වෙතත් මෙහිදී ජිනදාස තර්ක කර සිටින්නේ තමා දංගොල්ල කාලාවරෝධයෙන් අත්කර ගෙන ඇති බවයි.

නලීන් ඔබගේ උපදෙස් අපේක්ෂා කරයි. නලීන්ට උපදෙස් දෙන්න.

02. *"සුවසෙවන"* නැමැති වැඩිහිටි නිවාසය භාරකාර මණ්ඩලයක් මඟින් පාලනය කරනු ලබයි. මෙම නිවාසයේ කළමනාකරු වශයෙන් ෆොන්සේකා මහතා භාරකාර මණ්ඩලය විසින් පත් කරන ලදී. ෆොන්සේකා මහතා පදිංචිව සිටියේ මෙම නිවාසය තුළම ය. කළමනාකරු වශයෙන් ෆොන්සේකා මහතාට නිවාසය නඩත්තු කිරීම, එහි සේවකයන්ට නිවාඩු අනුමත කිරීම, වැටුප් ගෙවීම සහ සුළු විනය කටයුතු විමර්ෂණය කිරීම සඳහා බලය ලබා දී තිබුණි. මොහුගේ කාර්යභාරය භාරකාර මණ්ඩලයේ රීති හා රෙගුලාසි වල විග්‍රහ කර තිබුණි.

ෆොන්සේකා මහතා නිවාසයේ සේවකයන් දෙදෙනකු දූෂණ චෝදනා මත ගෘහස්ත පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව ඉවත් කළේය. සේවකයන් දෙදෙනා ඔවුන් සේවයෙන් ඉවත් කිරීමට විරුද්ධව භාරකාර මණ්ඩලයට අභියාචනා කළහ. කිසිදු පරීක්ෂණයක් නොපවත්වා භාරකාර මණ්ඩලය ෆොන්සේකා මහතාගේ සේවය අවසන් කළේය. ෆොන්සේකා මහතාගේ සේවය අවසන් කරන විට ඔහු නිවාසයේ වසර 15 ක් සේවය කර තිබුණි.

ෆොන්සේකා මහතා තමා නවාතැන් ලැබීම මඟින් ලද බුක්තිය නැවත ලබා ගැනීමට අපේක්ෂා කරයි.

ෆොන්සේකා මහතාට උපදෙස් දෙන්න.

03. "බුක්ති විඳීමේ අයිතිය තුළ බුක්තිය ආරක්ෂා කර ගැනීමේ අයිතිය ද ගම්‍ය වේ. එනම් හිමිකරු මඟින් ලබාගෙන, බුක්ති විඳීමට අයිතියක් නැති පුද්ගලයකුගේ බුක්තිය නැවත ලබා ගැනීමයි."

R.W.Lee.Introduction to Roman Dutch Law පි.121

ඉහත ප්‍රකාශය සහ විනිශ්චිත නඩු තීරණ ඇසුරින් අයිතිය ප්‍රකාශ කිරීමේ නඩුකරයක ( Rei - vindlicatio) විෂය පථය විනිශ්චිත විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

04. "මහගෙදර" හිමිකරු වූ නිහාල්ට 1990 වසරේ දී ඔස්ට්‍රේලියානු විශ්වවිද්‍යාලයක කථිකාචාර්ය පදවියක් ලැබුණි. මෙම පත්වීම දිගු කාලයක් සඳහා වූ බැවින් නිහාල් සිය බිරිඳ ශාමිනී සහ එකම පුතු චරක සමඟ ඔස්ට්‍රේලියාවට යාමට තීරණය කළේය. මෙම කාලය තුළදී "මහගෙදර" බලා ගන්නා මෙන් ඔහු තමාගේ දුරස්ථ ඥාති සහෝදරයකු වන අනිල්ගෙන් ඉල්ලා සිටියේය.

අනිල් 1990 දී මහගෙදර බුක්තියට පැමිණි අතර මහගෙදර නඩත්තු කටයුතු සියල්ල දිගටම සිදු කළේය. නිහාල් නිවාඩුව සඳහා ලංකාවට පැමිණි අවස්ථාවලදී "මහගෙදර" ගත කිරීමට පුරුදු වී සිටියේ ය.

1995 වසරේ දී නිහාල් අන්තිම කැමති පත්‍රයක් රහිතව ඔස්ට්‍රේලියාවේදී මිය ගියේය. නිහාල්ගේ මරණයෙන් පසු 1995 දී ශාමිනී තම පස් හැවිරිදි පුතු චරක සමඟ ලංකාවට පැමිණියාය. ශාමිනී "මහගෙදර" පදිංචියට යාමට සූදානම් වූ අවස්ථාවේ දී අනිල් මහගෙදරින් නික්ම යාම ප්‍රතික්ෂේප කළේය. මේ වන විට අනිල් "මහගෙදර" එක් කාමරයක් තුන් වැනි පාර්ශ්වයකට කුළියට දී තිබුණි.

1996 වසරේදී ශාමිනී අනිල්ට විරුද්ධව අයිතිය ප්‍රකාශ කිරීමේ නඩුකරයක් පැවරුවා ය. ප්‍රමාණවත් සාක්ෂි නොමැතිවීමේ හේතුව මත අයිතිය ප්‍රකාශ කිරීමේ නඩුකරය 2005 වසරේදී ඉවත දමන ලදී. අනිල් තවදුරටත් මහගෙදර බුක්තියෙහි සිටියේ ය.

සාකච්ඡා කරන්න.

05. අප්පුහාමි තම ඉඟුරු වගාව බණ්ඩාට විධිමත්ව විකුණුවේ ය. විකුණූ දිනයේ සිට අවුරුද්දක් ඇතුළත විකුණුම් මිල ගෙවීමට බණ්ඩාට කල් දෙන ලදී. ඉඩම සාමාන්‍ය හා ස්වාභාවික පාවිච්චිය සඳහා පමණක් යෙදිය යුතු බවට වගන්තියක් ද එම විකිණීමේ ගිවිසුමෙහි ඇතුළත් විය. බණ්ඩා එම ඉඟුරු වගාවේ එලදාව තෙවන පාර්ශ්වයකට විකුණුවේ ය. පසුව බණ්ඩා එහි මිරිස්, ඔකිඩ් හා ඇන්තූරියම් ද වගා කළ අතර පැළ වගාව සඳහා වතුර දැමීමට වතුර විසුරුවන යන්ත්‍රයක් ද සවි කළේය. කෙසේ වෙතත් එකඟ වූ දිනට ප්‍රථමයෙන් විකුණුම් මිල ගෙවීමට බණ්ඩා අපොහොසත් වූ හෙයින් විකිණීමේ හිමිකම බල රහිත බවට පත් විය.

බණ්ඩා නෙරපා හැරීමට අප්පුහාමි කටයුතු කළ විට ඉඟුරු එලදාව නිෂ්පාදනය කිරීමට ගිය වියදම, මිරිස්, ඔකිඩ් හා ඇන්තූරියම් වැවීමට සහ වතුර විසුරුවන යන්ත්‍රය සවි කිරීමට ගිය වියදම සඳහා වන්දි සහ දේපල තුළ රැඳී සිටීමේ අයිතිය බණ්ඩා ඉල්ලා සිටියේ ය. තවද මිරිස්, ඔකිඩ් හා ඇන්තූරියම් විකිණීමෙන් උපයා ගත හැකිව තිබූ ආදායම ද බණ්ඩා වන්දි වශයෙන් ඉල්ලා සිටියේ ය.

සාකච්ඡා කරන්න.

06. පහත සඳහන් අවස්ථාවන් සලකා බලන්න.

අ. රමාල් සහ ටිකිරි "සුනිමල්" නමැති නිවසේ සහ දේපලෙහි හවුල් අයිතිකරුවෝ වෙති. රමාල් තම අධ්‍යාපන කටයුතු සඳහා විදේශගත වූ අතර ටිකිරි එම නිවස සුරාජ්ට බදු දුන්නේ ය. "සුනිමල්" නැමති මෙම නිවස හා දේපලට කාලාවරෝධී අයිතියක් අත්කර ගැනීමට හැකිදැයි සුරාජ්ට උපදෙස් දෙන්න.

ආ. "නාඔටුන්න" නමැති තේ වතුයායේ හවුල් අයිතිකාරියක වූ අමෝදා එහි අනෙක් හවුල් අයිතිකාරියන් වූ දයානිගේ සහ අනුලාගේ අනුමැතිය මත, එම වතුයායේ බුක්තියට පිවිසියා ය. තම පවුලේ පදිංචිය සඳහා නිවසක් තැනීමටත් අක්කර භාගයක භූමි ප්‍රමාණයක් එළිපෙහෙළි කර එහි තේ වගා කිරීමටත් අමෝදා විශාල මුදල් ප්‍රමාණයක් වැය කළා ය.

ඉඩම බෙදුම් නඩු තීන්දුවකින් බෙදා වෙන් කළ විට තමා කළ වැඩි දියුණු කිරීම් සඳහා අමෝදා වන්දි ඉල්ලා සිටියා ය. එසේවුවද අනෙකුත් හවුල් අයිතිකාරියන්ගේ තර්ක වන්නේ එම වැඩි දියුණු කිරීම ඔවුන්ගේ අනුමැතිය නොමැතිව සිදු කළ නිසා ඇයට වන්දි ලැබීමට අයිතිවාසිකමක් නොමැති බවයි.

අමෝදාට උපදෙස් දෙන්න.

07. අ. බන්දුගේ නිවස රක්ෂිත වනාන්තරයකින් වට වූ කුඩා ගම්මානයක පිහිටා තිබුණේ ය. බන්දු ඇතුළු ඔහුගේ පවුලේ සාමාජිකයින් මහා මාර්ගයට ප්‍රවිෂ්ඨ වනුයේ ලින්ටන්ට අයිති ඉඩමක් හරහා වැටී තිබුණු අඩි පාරකිනි. මෙම අඩිපාර වැටී ඇත්තේ සොර කල්ලියක් සැඟ වී සිටීමට භාවිතා කරන ඉතා පාළුවට ගිය ඉඩමක් මතිණි. කිහිප අවස්ථාවකදී ම බන්දුගේ පවුලේ සාමාජිකයින්ට මෙම සොර කල්ලියෙන් තර්ජන එල්ල වී තිබුණි. එමෙන්ම මෙම අඩිපාරේ සිට මහා මාර්ගයට යන මාර්ගය ඉතා දීර්ඝ හා දුෂ්කර වේ.

කෙසේ නමුත් මහා මාර්ගයට ප්‍රවිශ්ඨ වීම සඳහා ලින්ටන්ට අයත් කුඹුරක් මතින් විකල්ප ප්‍රවිශ්ඨ මාර්ගයක් ද විය.

මෙම හේතුන් නිසා බන්දු, ලින්ටන්ගෙන් මහා මාර්ගයට ප්‍රවිශ්ඨවීමට ඇති විකල්ප මාර්ගය භාවිතා කිරීමට අවසර ඉල්ලා සිටියි. ලින්ටන්, බන්දුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරයි.

සාකච්ඡා කරන්න.

ආ. "පරවශතාවයක් එය අත්කර ගන්නා හෝ නිර්මාණය කරන තෙක් දේපළ සම්බන්ධ අයිතියක් මෙන්ම නිශ්චල දේපළක් ද නොවේ. එමෙන්ම පරවශතාවයක්, කාලාවරෝධ ආඥා පනතේ 3 වන වගන්තිය යටතේ කාලාවරෝධය කළ නොහැක. "

*දේපල නීතිය, 3 වන පිළුව. පිටු 62-63*

විනිශ්චිත නඩු තීරණ ආශ්‍රයෙන් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව අගයන්න.

08. පහත සඳහන් මාතෘකා <u>දෙකක්</u> පිළිබඳ සටහන් ලියන්න.

අ. පෝලියන් නඩුකරයේ විෂය පථය

ආ. සීමා නිර්ණය කිරීමේ නඩුකරය

ඇ. උකස් කර බලාත්මක කිරීම.

ඈ. එක්සෙප්ටියෝ රෙයි වින්ඩිටායි එට් ට්‍රැඩිටායි (Exceptio rei vinditae et traditae) සිද්ධාන්තයේ අදාලතාවය.

- හිමිකම් ඇවිරිණි. -